සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

03 S I

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (03) ත්‍රිපිටක ධර්මය - I පත්‍රය

පැය එකයි

**සැලකිය යුතුයි :**

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
* ඔබට පිළිතුරු ලිවීමට ලබාදෙන පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න. තවද, එම පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

1. බුදුරජාණන් වහන්සේ විසින් අවබෝධ කරගත් උතුම් ධර්මය ගුරුතන්හි තබා කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගන්නා ලද්දේ,
   (1) අවබෝධ කරගත් ධර්මය ඉතා ගැඹුරු බැවිනි.
   (2) තමන් වහන්සේට ගුරුවරයකු වීමට තරම් අයකු නොමැති බැවිනි.
   (3) ධර්මය තමන් වහන්සේ විසින්ම අවබෝධ කරගත් බැවිනි.
   (4) ශ්‍රාවක පිරිසට නායකත්වය ලබාදීමට පහසු බැවිනි.

2. දියුණු කළ සිත් ඇති උතුමන්ට තමාගේ කය තුළින් තමා හා සමාන සර්වාංග පරිපූර්ණ කයක් නිර්මාණය කර ශරීරයෙන් බැහැරට ගත හැකි ය. එසේ කළ හැකි වන්නේ,
   (1) ඉද්ධිවිධ ඤාණයෙනි. (2) යමක පාටිහාරිය ඤාණයෙනි.
   (3) මනෝමය ඉද්ධි ඤාණයෙනි. (4) ආසයානුසය ඤාණයෙනි.

3. ධර්මය බෙදා දැක්වූ බැවින් ද අනූන ගුණයෙන් යුක්ත වූ බැවින් ද භාග්‍ය ධර්මයෙන් යුක්ත වූ බැවින් ද බුදුරජාණන් වහන්සේ,
   (1) බුද්ධ නම් වේ. (2) භගවා නම් වේ.
   (3) ලෝකවිදූ නම් වේ. (4) සුගත නම් වේ.

4. මජ්ඣිමනිකායේ මාරතජ්ජනීය සූත්‍රයේ සඳහන් පරිදි මාරයා තම සිරුර තුළ පෙරළි කළ අවස්ථාවේ තමන් ද පෙර මාරයෙක්ව උපන් බව සඳහන් කරමින් මාරයාට තර්ජනය කරන ලද්දේ,
   (1) සාරිපුත්ත මහරහතන් වහන්සේ ය.
   (2) මොග්ගල්ලාන මහරහතන් වහන්සේ ය.
   (3) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ය.
   (4) අස්සජි මහරහතන් වහන්සේ ය.

5. 'රෝගාදියෙන් ආතුර වූ දෙතිස් කුණපයෙන් අපවිත්‍ර වූ කුණු වූ මෙම ශරීරය දෙස බලන්න. ශරීරය ගැන ඇති ඡන්දය දුරුකරන්න.' යනුවෙන් වදාරමින් බුදුරජාණන් වහන්සේ ඛේමා බිසව උදෙසා දේශනා කළ සූත්‍ර දේශනාව කුමක් ද?
   (1) මහානිදාන (2) මහාපදාන (3) මහාසීහනාද (4) මහාකම්මවිභංග

6. බුද්ධඝෝෂ මාහිමියන් ලක්දිවට වැඩමවීමට පෙර දඹදිව දී කළ අටුවාව කුමක් ද?
   (1) පපංචසූදනී (2) සාරත්ථප්පකාසිනී
   (3) මනෝරථපූරණී (4) අත්ථසාලිනී

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

7. සතර පාරාජිකාවන් සම්බන්ධයෙන් කියවෙන පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   A - පාරාජික ඇවතකට පත්වීම භික්ෂුත්වයෙන් පරාජයට පත්වීමකි.
   B - පාරාජික ආපත්ති ඡේද්‍යගාමිණී ඇවැත් ලෙස සැලකේ.
   C - පාරාජික ඇවතකට පත් වූ භික්ෂුවට නැවත උපසම්පදාව ලද හැකි ය.
   D - ශික්ෂා වැඩීමෙහි දුබලත්වයක් වේ නම් උපසම්පදාව ප්‍රතික්ෂේප කළ හැකි ය.
   (1) A, B සහ C    (2) A, B සහ D    (3) A, C සහ D    (4) B, C සහ D

8. උදායි තෙරුන් විසින් ස්ත්‍රීන්ට මෙවුන්දම හා සම්බන්ධ අසභ්‍ය කථා කළ බව අසා බුදුරජාණන් වහන්සේ පණවා වදාළ සංඝාදිසේස ශික්ෂාව කුමක් ද?
   (1) දුට්ඨුල්ලවාචා ය.    (2) අත්තකාමපාරිචරිය ය.
   (3) කාය සංසග්ග ය.    (4) සංචරිත්ත ය.

9. බුදුරජාණන් වහන්සේ විසින් දේශිත නවාංගසත්ථුසාසනයේ '**අබ්භූතධම්ම**' ලෙස දැක්වෙන්නේ,
   (1) බෝසත් චරිතය ආශ්‍රිත කතාවන් ය.
   (2) සියලු ගාථා සහිත සූත්‍රයන් ය.
   (3) ප්‍රීතිය, සංවේගය පදනම් කරගත් දේශනාවන් ය.
   (4) ආශ්චර්ය අද්භූත කරුණු සහිත දේශනාවන් ය.

10. දම්සක්පැවතුම් සූත්‍රයේ අටුවා දේශනාවක් ලෙස සැලකෙන සූත්‍රය කුමක් ද?
   (1) මහාකච්චාන භද්දේකරත්ත    (2) ධම්මඤ්ඤූ
   (3) සච්චවිභංග    (4) සංගාරව

11. සිගාලක සූත්‍රයේ සඳහන් අවේලාවේ වීථි සංචාරයේ ආදීනව අතර එන 'සංකියො ච හොති පාපකෙසු ඨානෙසු' යන ප්‍රකාශයෙන් අර්ථවත් වන්නේ,
   (1) තමාගේ රැකවරණය නැති වන බවයි.    (2) වැරදි, අපරාධවලට සැකකරුවකු වන බවයි.
   (3) බොහෝ දුක් කරදර පැමිණෙන බවයි.    (4) ධනයෙහි රැකවරණ නැතිවන බවයි.

12. අකුසලයෙන් මිදී කුසලය දියුණුකොට සිව්බඹ විහරණයෙන් වාසය කරන පුද්ගලයා ලබන අස්වැසිලි හතරක් කාලාම සූත්‍රයේ ඉගැන්වේ. එයට අයත් **නොවන්නේ** මින් කුමක් ද?
   (1) පරලොවක් තිබේනම් හොඳ කර්මවල විපාක ලැබේ නම් තමා අනිවාර්යයෙන් සුගතියට යන බව
   (2) පරලොවක් නැත්නම් නරක කර්මවල විපාක නැත්නම් මෙලොව දී සතුටින් ජීවත් වන බව
   (3) පව් කියා දෙයක් හා ඊට විපාක තිබේනම් පව් නොකරන තමාට දුක් විඳින්නට සිදු නොවන බව
   (4) අකුසල කර්ම හෝ කුසල කර්ම කිරීමෙන් තමාට යහපතක් හෝ අයහපතක් සිදු නොවන බව

13. පරාභව සූත්‍රයේ සඳහන් පිරිහීමේ කරුණු පමණක් ඇතුළත් වරණය තෝරන්න.
   A - හැකියාව තිබිය දී වියපත් මව්පියන්ට නොසැලකීම
   B - වංචා සහගත අයෙක් නිවසක ප්‍රධානත්වයට පත්වීම
   C - බොහෝ ධන සම්පත් ඇතිව තනිව භුක්ති විඳීම
   D - ජාතිය ධනය ගෝත්‍රය නිසා අනුන් හෙළා දැකීම
   (1) A, B සහ C    (2) A, B සහ D    (3) A, C සහ D    (4) B, C සහ D

14. ආපත්තිභය සූත්‍රයට අනුව ගැරහිය යුතු මොහොල් පහර දිය යුතු වරදක සේ බියක් ඇතිකරගත යුත්තේ කුමන ශික්ෂා පිළිබඳව ද?
   (1) සංඝාදිසේස    (2) පාරාජික    (3) අනියත    (4) පාටිදේසනීය

15. අභිධර්මයේ රූප විභාගයේදී අටවිසි රූපය ලක්ෂණ අටකින් යුක්තව දක්වා ඇත. එහි අනාරම්මණ ලෙස සැලකෙන්නේ,
   (1) රූප අරමුණු කොට කෙලෙස් උපදින බැවිනි.
   (2) ලෝභ මූල හෝ අලෝභ මූලයන්හි නොයෙදෙන බැවිනි.
   (3) චිත්ත චෛතසික මෙන් අරමුණු ගැනීමක් නැති බැවිනි.
   (4) කාමලෝකයට අයත් බැවිනි.

16. අභිධර්ම විග්‍රහයේ විශේෂ ආකාර 'විකාර' නම් වේ. එම විකාර රූප නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
   (1) උපචය, සන්තති, ජරතා    (2) ලහුතා, මුදුතා, කම්මඤ්ඤතා
   (3) චිත්ත, උතු, ආහාර    (4) සංයොගජ, විභාගජ, ශබ්දජ



Department of Examinations Sri Lanka

- **17, 18** හා **19** ප්‍රශ්නවල හිස්තැනට සුදුසු ම පිළිතුර තෝරන්න.

17. ඕරම්භාගීය සංයෝජන සහමුලින් සිඳලීමෙන් .................. භාවයට පත් වේ.
    (1) සෝවාන් (2) සකෘදාගාමී (3) අනාගාමී (4) අරහත්

18. ඉන්ද්‍රිය අරමුණු හා විඤ්ඤාණය එකට එක්වීමෙන් .................. ඇති වේ.
    (1) නාමරූප (2) සළායතන (3) ඵස්ස (4) වේදනා

19. බුදුරජාණන් වහන්සේ .................. අරබයා 'අලංකතොචෙපි සමං චරෙය්‍ය' ගාථාව දේශනා කළ සේක.
    (1) කුණ්ඩධාන තෙරුන් (2) ඡබ්බග්ගිය භික්ෂූන්
    (3) සන්තති ඇමතිවරයා (4) සුඛ කුමාරයා

20. ධම්මපදයේ සහස්ස වග්ගයේ එන 'මාසෙ මාසෙ සහස්සෙන' ගාථාවේ 'භාවිතත්තානං' ලෙස දක්වා ඇත්තේ,
    (1) කෙලෙසුන්ගෙන් පිරුණු තැනැත්තා ය.
    (2) යාගහෝම කරන බමුණා ය.
    (3) පිදිය යුත්තන් පුදන්නා ය.
    (4) කෙලෙසුන් නැසූ ආර්යන් වහන්සේ ය.

21. යමෙක් පාපයක් කරන්නේ ද එය නැවත නැවත නොකළ යුතු ය. යන අර්ථය කියවෙන ධම්මපදයේ පාප වග්ගයේ එන ගාථාවේ මුල් අර්ධය මින් කුමක් ද?
    (1) පාපං චෙ පුරිසො කයිරා - නතං කයිරා පුනප්පුනං
    (2) අභිත්ථරෙථ කල්‍යාණෙ - පාපා චිත්තං නිවාරයෙ
    (3) පුඤ්ඤං චෙ පුරිසො කයිරා - කයිරා ථෙතං පුනප්පුනං
    (4) පාපොපි පස්සති භද්‍රං - යාව පාපං න පච්චති

22. අකුසල සිතිවිලි ශාරීරිකව හා වාචසිකව ක්‍රියාත්මක වීමට ගන්නා අවස්ථාව හෙවත් **වීතික්කම** අවස්ථාව යටපත් කළ හැක්කේ,
    (1) සීලයෙනි. (2) සමාධියෙනි. (3) ප්‍රඥාවෙනි. (4) ධ්‍යානයෙනි.

23. ධර්මය, අධර්මය වෙන්කොට දැන ධර්මය වඩා ගැනීමටත්, අධර්මය බැහැර කිරීමටත්, කටයුතු කරන්නාගේ සිත කය දෙකෙහි ඇතිවන සැහැල්ලු බව,
    (1) ධම්මවිචය සම්බොජ්ඣංගය යි. (2) විරිය සම්බොජ්ඣංගය යි.
    (3) පීති සම්බොජ්ඣංගය යි. (4) පස්සද්ධි සම්බොජ්ඣංගය යි.

24. කර්ම විභාගයට අනුව ජනක කර්මයෙන් උපන් තැනැත්තාට ඉන් අනතුරුව විපාක දෙනු ලබන්නේ,
    (1) උපස්ථම්භක කර්මය යි. (2) උපපීළක කර්මය යි.
    (3) උපඝාතක කර්මය යි. (4) ආචිණ්ණ කර්මය යි.

25. ආර්ය අෂ්ටාංගික මාර්ගය ත්‍රිශික්ෂාවට බෙදා දැක්වීමේදී සීල ශික්ෂාවට අයත් අංග දෙකක් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
    (1) සම්මාදිට්ඨි - සම්මාසංකප්ප (2) සම්මාසංකප්ප - සම්මාවාචා
    (3) සම්මාකම්මන්ත - සම්මාආජීව (4) සම්මාආජීව - සම්මාවායාම

26. මහායාන සම්ප්‍රදායේ මූලික ඉගැන්වීම් අතරට අයත් නොවන්නේ මින් කුමක් ද?
    (1) දසභූමි සංකල්පය (2) පාරමිතා සංකල්පය
    (3) බෝධිචිත්ත සංකල්පය (4) තුන්තරාබෝධි සංකල්පය

27. ධර්ම දේශනාවක් පැවැත්වීමේදී ශ්‍රාවකයා තුළ එම දහම තහවුරු කරවීම දේශකයන් වහන්සේගේ ප්‍රධාන අපේක්ෂාව විය යුතු ය. ඒ සම්බන්ධයෙන් සච්චවිභංග සූත්‍රයේ සඳහන් කරුණු හත අතුරින් 'පඤ්ඤපනා' ලෙස දැක්වෙන්නේ,
    (1) දහම් කරුණු විස්තරාත්මකව පැහැදිලි කිරීම ය.
    (2) දහම් කරුණු හඳුනා ගැනීමට අවකාශ සැලසීම ය.
    (3) හඳුනාගත් දහම් කරුණු තහවුරු කිරීම ය.
    (4) තහවුරු කළ දහම් කරුණු විවෘත කර දැක්වීම ය.

28. පාලකයකුගේ ධාර්මිකත්වය යනු කුමක්දැයි චක්කවත්තිසීහනාද සූත්‍රයේ දක්වා ඇත. එහි 'ධම්මං මානෙන්තො' ලෙස දක්වා ඇත්තේ,
    (1) ධර්මයට අවනතව ක්‍රියා කරන්නෙක් වීම ය. (2) ධර්මයට ගරුකරන්නෙක් වීම ය.
    (3) ධර්මය ධජයක් සේ සැලකීම ය. (4) ධර්මය අධිපති කොට සැලකීම ය.

[ 4 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

29. සිය රැකියාව කිරීමේදී විෂමාචාරයන්ට හසු නොවී කටයුතු කිරීමට වගබලාගත යුතු ය. එහිදී 'විපරාමොස' ලෙස දැක්වෙන්නේ කුමක් ද?
   (1) අල්ලස් ගැනීම (2) රැවටීම (3) හිංසන (4) මං පැහැරීම

30. තථාගත ධර්මයෙන් පෙන්වන මාර්ගය හා නිර්වාණ ඵලය තමාට මෙලොවදීම අත්දැකිය හැකි ය. එබැවින් ශ්‍රී සද්ධර්මය,
   (1) සන්දිට්ඨික ය. (2) අකාලික ය. (3) ඒහිපස්සික ය. (4) ඕපනයික ය.

31. ආසවට්ඨානීය ධර්ම පහළවීමත් සමග සාසනයෙහි විනය නීති පැනවීමේ අවශ්‍යතාව මතු විය. එම ධර්ම අතර 'වෙපුල්ල මහත්තතා' ලෙස දක්වා ඇත්තේ,
   (1) ලාභ ප්‍රයෝජන බහුලවීමයි. (2) බහුශ්‍රැතයන් බහුලවීමයි.
   (3) පැවිදිව කල් ගත වූ භික්ෂූන් බහුලවීමයි. (4) සංඝයා පිරිස වශයෙන් විශාලවීමයි.

32. සතර සංවර සීලයට අයත්වන ආජීව පාරිසුද්ධ සීලය ලෙස සැලකෙන්නේ,
   (1) ප්‍රාතිමොක්ෂ ශික්ෂා ආරක්ෂා කිරීමයි. (2) ඉන්ද්‍රිය සංවරයයි.
   (3) ජීවන පිළිවෙත පිරිසිදුව තබා ගැනීමයි. (4) ප්‍රත්‍යවේක්ෂාවෙන් සිව්පස පරිභෝගයයි.

33. 'ඒක නාම කිං' ආදී ප්‍රශ්න ඇසීමෙන් සිදුකරන පැවිද්ද හා උපසම්පදාව
   (1) ඕවාද පටිග්ගහණ නම් වේ. (2) පඤ්හ ව්‍යාකරණ නම් වේ.
   (3) අට්ඨවාචක නම් වේ. (4) සරණාගමන නම් වේ.

34. ධම්මඤ්ඤූ සූත්‍රයෙහි යම් භික්ෂුවක් මත්තඤ්ඤූ ලෙස දක්වා ඇත්තේ,
   (1) ධර්මයෙහි අර්ථ දන්නා බවයි. (2) තමා පිළිබඳව දන්නා බවයි.
   (3) සිව්පස පරිභෝගයේ පමණ දන්නා බවයි. (4) කාලය පිළිබඳව දන්නා බවයි.

35. අභිධර්මයේ චෛතසිකධර්ම අතර එන **පකිණ්ණක** චෛතසික නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.
   (1) ඵස්ස, වේදනා, සඤ්ඤා, චෙතනා, ඒකග්ගතා, ජීවිතින්ද්‍රිය
   (2) විතක්ක, විචාර, අධිමොක්ඛ, විරිය, පීති, ඡන්ද
   (3) මොහ, අහිරික, අනොත්තප්ප, උද්ධච්ච, ලොභ, දිට්ඨි
   (4) සද්ධා, සති, හිරි, ඔත්තප්ප, අලොභ, අදොස

36. මරණානුස්සති, උපසමානුස්සති, ආහාරෙ පටික්කුල සඤ්ඤා, ධාතු මනසිකාර වැනි කර්මස්ථාන වඩාත් යෝග්‍ය වන්නේ කුමන චරිතය උදෙසා ද?
   (1) බුද්ධි චරිතයාට ය. (2) රාග චරිතයාට ය.
   (3) මෝහ චරිතයාට ය. (4) සද්ධා චරිතයාට ය.

37. ෂඩ් ශාස්තෘන් අතර සප්ත පදාර්ථවාදයක් ඉදිරිපත් කරන ලද්දේ,
   (1) පූර්ණකාශ්‍යප ය. (2) මක්ඛලීගෝසාල ය.
   (3) පකුධකච්චාන ය. (4) අජිතකේසකම්බල ය.

38. සමාධි භාවනාවට යොමුවන යෝගාවචරයාට අහිතකරවන, බාධා ඇතිකරවන පළිබෝධ දහයකි. ඉන් 'අද්ධාන' ලෙස දැක්වෙන්නේ,
   (1) තමා හමුවට පැමිණෙන පිරිස් බහුලවීම ය. (2) ඉදිකිරීම්, අලුත්වැඩියා කිරීම් බහුලවීම ය.
   (3) නිතර ගමන් බිමන් යාමට පුරුදුවීම ය. (4) ලැබූ ඍද්ධිය රැකගැනීමට වෙහෙසවීම ය.

39. ස්වකීය මිත්‍රයාගේ හොඳ ක්‍රියාව ද නරක ක්‍රියාව ද අනුමත කරමින් ඇති තැන ගුණ කියා නැති තැන අගුණ කියමින් කටයුතු කරන මිත්‍ර ප්‍රතිරූපකයා,
   (1) අනුප්පියභාණී නම් වේ. (2) අපායසහාය නම් වේ.
   (3) වචීපරම නම් වේ. (4) අඤ්ඤදත්ථුහර නම් වේ.

40. භික්ෂූන් වහන්සේලා හතරනමකට වැඩි සංඛ්‍යාවක් සීමාවකට එක් වූ අවස්ථාවක දී ප්‍රාතිමොක්ෂය දේශනා කරමින් සිදු කරන උපෝසථය කුමක් ද?
   (1) පුග්ගල (2) සුත්තුද්දේස (3) පාරිසුද්ධි (4) අධිට්ඨාන

* * *

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි/
முழுப் பதிப்புரிமையுடையது/
All Rights Reserved]

03 S II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2568 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2024 (2025)

## (03) ත්‍රිපිටක ධර්මය - II පත්‍රය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

I කොටසේ ප්‍රශ්නය ද, II හා III යන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

**1.** පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) බුදුරජාණන් වහන්සේ 'සත්ථා දේවමනුස්සානං - දෙවි මිනිසුන්ට ශාස්තෘ' වන සේක. මෙහි සඳහන් සත්ථා දේවමනුස්සානං යන්නට අර්ථ දෙකක් දක්වන්න.

(ii) භික්ෂූන් වහන්සේ නිතර සිහිකළ යුතු යැයි සැලකෙන ධර්ම අතර සීල සමානත්වයෙහි ස්වභාව දෙකක් ලියන්න.

(iii) 'උපසම්පදා' යන වචනයට දළ අදහස් දෙකක් ඉදිරිපත් කරන්න.

(iv) භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න.

(v) බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් පළමු සතියේ බෝමැඩ වැඩ සිටිමින් පටිච්චසමුප්පාදය මෙනෙහි කළ ආකාර දෙක පෙන්වා දෙන්න.

(vi) සංඝාදිසේසාපත්තියකට පත් භික්ෂූන් වහන්සේට පාරිශුද්ධිය උදෙසා අනුගමනය කෙරෙන විනයානුකූල ක්‍රියාමාර්ගයේ අංග දෙකක් සඳහන් කරන්න.

(vii) බුදුරජාණන් වහන්සේ මහාකරුණා සමාපත්ති ඥාණයෙන් ලෝකය දෙස බලා වදාරණ ආකාර දෙක ලියා දක්වන්න.

(viii) 'වාණිජො'ව භයං මග්ගං - අප්පසත්ථො මහද්ධනො,
විසං ජීවිතුකාමො'ව - පාපානි පරිවජ්ජයෙ'
ඉහත ගාථාවෙහි පවට බියෙන් පව දුරුකළ යුතු බව උපමා දෙකක් ඇසුරෙන් පෙන්වා දෙයි. එහි ඇතුළත් උපමා දෙක ගෙනහැර දක්වන්න.

(ix) සෝවාන් ඵලයට පත් ආර්යශ්‍රාවකයා මුළුමනින්ම ප්‍රහීණ කරන සංයෝජන ධර්ම දෙකක් නම් කරන්න.

(x) උපසපන් භික්ෂූන් වහන්සේ නමකට වස්විසූ ආවාසයෙන් බැහැරවීමේදී අධිෂ්ඨාන කළ හැකි ආකාර දෙක දක්වන්න.

*(ලකුණු 02 × 10 = 20 යි)*

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

## II කොටස

**2.** (i) බුදුරදුන් විසින් දේශිත සද්ධර්මය 'සන්දිට්ඨික' යැයි පැවසීමට හේතු දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) සද්ධර්ම දේශකයකු දහම් දෙසීමේදී පිළිපැදිය යුතු කරුණු පහක් බුදුරදහු පෙන්වා දුන්හ. ඒ අතුරින් **තුනක්** ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) බුදුරජාණන් වහන්සේ තුළ පැවති නිහතමානි ගුණය හඳුන්වා එය ප්‍රකට වූ අවස්ථා දෙකක් කෙටියෙන් විස්තර කරන්න. *(ලකුණු 05 යි)*

**3.** (i) 18 වැනි සියවසේ ශ්‍රී ලංකාව ශාසනික, ජාතික, සාමාජික, සංස්කෘතික හා අධ්‍යාපනික වශයෙන් පරිහානියට පත්වීමට බලපෑ හේතු දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) වැලිවිට සරණංකර මාහිමියන් වහන්සේ පරිහානියට පත්ව තිබූ ශාසනික තත්ත්වය පුනර්ජීවනයට පත් කරලීමෙහිලා අනුගමනය කළ ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් පහදන්න. *(ලකුණු 03 යි)*

(iii) වැලිවිට සරණංකර මාහිමියන් වහන්සේගේ ධර්ම-ශාස්ත්‍රීය සේවාව, ග්‍රන්ථකරණය, ශිෂ්‍ය පිරිස හා විද්‍යාස්ථාන ඇති කිරීම යන කරුණු ස්ඵුට කරමින් අගයන්න. *(ලකුණු 05 යි)*

**4.** (i) සංඝාදිසේස ශික්ෂා ගරුකාපත්ති ලෙස සැලකීමට හේතු දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) අදින්නාදාන පාරාජිකාපත්තිය ලියා එහි අර්ථය ඉදිරිපත් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) අදින්නාදාන පාරාජිකාපත්තියෙහි නිදානය දක්වා එම ශික්ෂාවෙහි ඇතුළත් 'ථෙය්‍යසංඛාතං' යන්න විචාරයට ලක් කරන්න. *(ලකුණු 05 යි)*

## III කොටස

**5.** (i) 'යො චෙ ගාථා සතං භාසෙ' යන ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

(ii) එම ගාථාවේ අර්ථය සරල බසින් ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) කුණ්ඩලකේශී සිටු කුමරියගේ කථා වස්තුව දක්වා ස්ථානෝචිත ප්‍රඥාවෙන් කටයුතු කිරීමෙන් ජීවිතය ජයගත හැකි බව විමසීමට ලක් කරන්න. *(ලකුණු 05 යි)*

**6.** (i) තෙවැනි ධර්ම සංගීතිය පැවැත්වීමෙහිලා බලපෑ සාධක දෙකක් දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) නායකත්වය, දායකත්වය හා ස්ථානය සඳහන් කරමින් තෙවැනි ධර්ම සංගීතිය සංවිධානය කළ ආකාරය සාකච්ඡා කරන්න. *(ලකුණු 03 යි)*

(iii) තෙවැනි ධර්ම සංගීතියෙහි ප්‍රතිඵල ශාසන චිරස්ථිතියෙහිලා ඉවහල් වූ අයුරු පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

**7.** (i) සිගාලක සූත්‍රයෙහි සඳහන් තුදුස් ලාමක ධර්ම කොට්ඨාස අතරින් ප්‍රභේද දෙකක් ලියා දක්වන්න. *(ලකුණු 02 යි)*

(ii) සිගාලක සූත්‍රයෙහි ඇතුළත් ධර්ම-විනයට අනුගත සදිසා නමස්කාරය ගෙනහැර දක්වන්න. *(ලකුණු 03 යි)*

(iii) යුතුකම් හා වගකීම් මගහැරෙන වර්තමාන සමාජයට සිගාලක සූත්‍රයේ මව්පිය උපස්ථානය හා දාරක අනුකම්පාව සපයන ආදර්ශය පෙන්වා දෙන්න. *(ලකුණු 05 යි)*

* * *

Department of Examinations Sri Lanka